# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.12. 11

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2017

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2017 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම**

**01. ප්‍රසාද දීමනා ගෙවීම**

2017 වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම 2017 දෙසැම්බර් 06 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි අනුමත කර ඇත.

| අනු අංකය | ආයතනික වර්ගීකරණය | යෝජිත ප්‍රසාද දීමනාව |
|---|---|---|
| 1. | පෙර වර්ෂයේ අලාභදායී තත්ත්වය අදාළ වර්ෂය තුළ ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුළත්ව අදාළ මුදල් වර්ෂය තුළ ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්යසාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 15,000/- |
| 2. | පෙර වර්ෂයේ අලාභදායී තත්ත්වය අදාළ වර්ෂය තුළ ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුළත්ව අදාළ මුදල් වර්ෂය තුළ ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්යසාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 13,500/- |

| | | |
|---|---|---|
| 3. | අදාළ මුදල් වර්ෂය තුළ අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති, එහෙත් පසුගිය මුදල් වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 5,000/- |
| 4. | අදාළ මුදල් වර්ෂය තුළ අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව පූර්ව මුදල් වර්ෂයට සාපේක්ෂව අඩු කර ගැනීමට අපොහොසත් වූ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, එවැනි ආයතන වල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා. | රු. 3,000/- |

**02.** භාණ්ඩාගාර එකඟත්වය

2.1 අදාළ මුදල් වර්ෂය තුළ අලාභදායී තත්ත්වයක් වාර්තා කර ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීමට ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගත යුතු ය. මේ සඳහා වන ඉල්ලීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව/ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**03.** අනුගමනය කළ යුතු පිළිවෙළ

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටෙක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතු ය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය.
මෙහි දී සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් ආදී සියලු ගෙවීම් අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන යටතේ ගෙවීමට සියලුම රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල අවධානය යොමු විය යුතු ය.

3.3 ඉහත පරිදි දීමනා ගෙවීම සඳහා, අදාළ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වාර්ෂික ගිණුම්, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධ උපදෙස් නිසි පරිදි පිළිපැද තිබිය යුතු ය.

**04.** විශේෂ කරුණු

4.1. ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මඟින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ.

4.3. ඉකුත් වර්ෂවලදී සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීමට විශේෂ අනුමැති ලබා ගෙන ඇති සහ සහ මෙම වසරේ දී ද එකී පටිපාටියම අනුගමනය කිරීමට අදහස් කරන ආයතන 2017 වර්ෂය වෙනුවෙන් එසේ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

4.4. මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එක් එක් ආයතන විසින් ප්‍රසාද දීමනා ගෙවීමට අදාළව පසුගිය වසර තුළ අනුගමනය කරන ලද නිර්ණායක පදනම් කරමින් මෙම වසරේ ද ප්‍රසාද දීමනා ගෙවිය යුතු වේ.

**05. පැහැදිලි කර ගැනීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විමසන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.එච්.එස්. සමරතුංග
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. සම සභාපති, ජාතික වැටුප් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව